**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2018

## (AA22) පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Cost Accounting and Reporting)

---

ප්‍රශ්න 10 ක් සහිත කොටස් 4 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත විය. එමගින් පිරිවැය ගිණුම්කරණයට අදාල මූලික සංකල්ප පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන් සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු විය. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රය සමග අමුණා තිබුණි. ප්‍රශ්න 10 සකසා තිබුණේ පහත සඳහන් පරිදිය:

**A – කොටස -** ලකුණු 20

එකකට ලකුණු 1 ක් හෝ 2 ක් බැගින් වූ එකිනෙකට වෙනස් ස්වරූපයෙන් යුතු වාස්තවික පරීක්ෂණ ප්‍රශ්නවලින් සමන්විත විය. සියලුම ප්‍රශ්න වලට උත්තර ලිවිය යුතු විය.

**B – කොටස -** ලකුණු 25

එකකට ලකුණු 5 ක් බැගින් වූ අනිවාර්යය ප්‍රශ්න පහකි.

**C – කොටස -** ලකුණු 30

එකකට ලකුණු 10 බැගින් වූ අනිවාර්යය ප්‍රශ්න තුනකි.

**D – කොටස -** ලකුණු 25

කොටස් දෙකකින් යුතු එක් අනිවාර්ය ප්‍රශ්නයකි. (A) කොටසට ලකුණු 14 කුත්, (B) කොටසට ලකුණු 11 ක් සහිත එක් අනිවාර්යය ප්‍රශ්නයක් වශයෙනි.

විභාගයේදී අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. බහුතරයක් අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රය සඳහා වෙන්කර තිබූ කාලය කළමනාකරණය කරගෙන තිබූ බව නිරීක්ෂණය විය. එක් එක් ප්‍රශ්නය සඳහා යොදා ගතයුතු කාලය පිළිබඳ මාර්ගෝපදේශය වෙන්කළ ලකුණු මගින් සපයා තිබුණි.

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය මූලික පිරිවැය ගිණුම්කරණ මූලධර්ම සහ මූලික ගණනය කිරීම් කෙරෙහි ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සපයා තිබූ අතර, ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට සමත් වී තිබුණි.

මෙම ප්‍රශ්නය මඟින් පිරිවැය ගිණුම්කරණයේ අරමුණු, පිරිවැය ගිණුම්කරණයට සම්බන්ධ මූලික පද, පිරිවැය පොත් තැබීම, පිරිවැය වර්ගීකරණය, පොදුකාර්ය පිරිවැය විභජනය කිරීමේ පදනම, තොග පාලන පද්ධති, ගෙවීම් ක්‍රම යනාදිය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි.

අයදුම්කරුවන් විසින් විෂයය පිළිබඳව ඔවුන් සතුවූ පරිපූර්ණ දැනුම පෙන්වීම අපේක්ෂිත විය.

සියලුම අයදුම්කරුවන් වාගේ ප්‍රශ්න අංක 1.7 සඳහා සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත්ව තිබුණි. මෙම ප්‍රශ්නය පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ පදනම තෝරාගැනීම සම්බන්ධයෙන් විය. අනෙකුත් ප්‍රශ්න සඳහාද අයදුම්කරුවන් හොඳින් උත්තර සපයා තිබුණි.

අයදුම්කරුවන් විසින් පොදුවේ කර තිබූ වැරදි පහත පරිදි විය:

- කාලය පදනම් කරගත් ගෙවීම් ක්‍රමය සම්බන්ධයෙන් වූ ප්‍රශ්න අංක 1.5 සඳහා සාර්ථකව උත්තර සපයා නොතිබුණි. කාලය පදනම් කරගත් ගෙවීම් ක්‍රම වඩාත් යෝග්‍ය වන්නේ කාර්යයවල ප්‍රමාණාත්මකභාවයට වඩා ගුණාත්මකභාවය වැදගත්වන අවස්ථාවන්හිදිය. ඒ අනුව නිවැරදි උත්තරය (1) විය. නමුත් අයදුම්කරුවන් වෙනත් උත්තර තෝරාගෙන තිබුණි.
- බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්න අංක 1.6 (2) සඳහා පොරොත්තු කාලය සහ තත් කාලය යන සංකල්ප වෙන්කර ගැනීමට සමත්ව නොතිබුණි. පොරොත්තු කාලය යනුවෙන් අදහස් කරන්නේ භාණ්ඩ ඇණවුම් කිරීම සහ භාණ්ඩ ලැබීම අතරතුර කාලය බවත් තත් කාලය යනු තොග පාලන පද්ධතියක් බවත් අයදුම්කරුවන් තේරුම්ගත යුතුවේ.
- බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්න අංක 1.6 (3) හා 1.8 (3) සඳහා උත්තර සැපයීමේදී සංකලිත හා අසංකලිත ගිණුම්කරණ පද්ධතිවල ලක්ෂණ හා මූලික කරුණු වෙන් වෙන්ව හඳුනා ගැනීම පිළිබඳ ගැටළු පෙන්නුම්කර තිබුණි.

අයදුම්කරුවන් න්‍යායාත්මක කොටස් හා ගණනය කිරීම් ඇතුළුව විෂයට අදාල සියලුම කොටස් පිළිබඳ මනා අවබෝධයක් හා දැනුමක් ලබා ගැනීම අපේක්ෂා කෙරේ. විෂයයට අදාල හොඳ දැනුමක් ලබාගැනීම සඳහා ගණනය කිරීම් පිළිබඳ දැනුම පමණක් ප්‍රමාණවත් නොවන අතර, න්‍යායාත්මක දැනුමද එකසේ වැදගත් වේ.

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයේදී පරීක්ෂා කරනු ලැබුවේ කාර්යය පිරිවැයකරණ ක්‍රම නිවැරදිව භාවිත කිරීමේ හැකියාව සහ දෙනලද කාර්යයක් සඳහා අයකළ යුතු මිල ගණනය කිරීමේ හැකියාවයි.

මෙහිදී, දෙනලද දෙපාර්තමේන්තු දෙක සඳහා ඍජු ශ්‍රමය සහ පොදුකාර්ය පිරිවැය ගණනය කිරීමට අදාලව කාර්යය සඳහා වන ඍජු හා වක්‍ර වියදම් නිවැරදිව හඳුනා ගැනීම අපේක්ෂා කෙරුණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.

අයදුම්කරුවන් විසින් පොදුවේ සිදුකරන ලද වැරදි පහත පරිදි වේ:

- ලාභාන්තිකය සහ අධිකය පිළිබඳව අයදුම්කරුවන්ට අඩු දැනුමක් පැවති බව නිරීක්ෂණය විය. සමාගම 25% ලාභාන්තිකයකට යටත්ව විකුණුම් මිල නියමකරන බව පැහැදිලිව සඳහන් කර තිබුණත්. සමහර අයදුම්කරුවන් 25% අදාල කර තිබුණේ මුළු පිරිවැය සඳහාය.
- සමහර අයදුම්කරුවන් භාණ්ඩ දෙකක් හෝ දෙපාර්තමේන්තු දෙකක් ලෙස සළකා උත්තර සපයා තිබුණි.

පිරිවැය ඒකකයක අන්තර්ගත වන පිරිවැය සංරචක පිළිබඳව අයදුම්කරුවන්ට පැහැදිලි දැනුමක් තිබීම අපේක්ෂා කෙරේ. පිරිවැයකරණයේදී විවිධ දෙපාර්තමේන්තුවල සේවා හා පිරිවැය වැදගත්වන බව විභජනය කිරීමේ පදනම අදාලවන බව අයදුම්කරුවන් තේරුම්ගත යුතුය. ලාභය පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස (mark-up) හෝ විකුණුම් මිලේ ප්‍රතිශතයක් (ලාභාන්තිකය) ලෙස පෙන්නුම්කල හැකිබව හා එම ක්‍රම දෙක වෙන් වෙන්ව හඳුනාගැනීම අවශ්‍ය වේ.

## ප්‍රශ්න අංක 03

අයවැයකරණය හා අයවැයගත පාලනයේ වාසි පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී.

(a) කොටස සඳහා දෙන ලද භාණ්ඩ දෙකකට අදාලව නිෂ්පාදන අයවැයක් පිළියෙල කිරීම සහ අයවැයගත පාලනයේ වාසි දෙකක් (02) සඳහන් කිරීම (b) කොටසින් අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කරන ලදී. නිෂ්පාදන අයවැය පිළියෙල කිරීම සඳහා ආරම්භක හා අවසාන තොග, කාලච්ඡේදයේ අපේක්ෂිත විකුණුම්වලට ගැලපිය යුතු බව පෙන්වීම අයදුම්කරුවන්ගෙන් පරීක්ෂා කරන ලදී.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. නමුත් සමහර අයදුම්කරුවන් අයවැයගත පාලනයේ වාසි දෙකක් සඳහන් කිරීම සඳහා වූ (b) කොටස සඳහා උත්තර සැපයීම මගහැර තිබුණි.

අයදුම්කරුවන් විසින් පොදුවේ සිදුකරන ලද වැරදි පහත පරිදි වේ:

- ආරම්භක සහ අවසාන තොග, විකුණුම් ඒකක ගැලපීම පිළිබඳව අයදුම්කරුවන්ට අඩු දැනුමක් පැවති බව නිරීක්ෂණය විය. නිෂ්පාදනය කල යුතු ඒකක ප්‍රමාණය ගණනය කිරීම සඳහා කාලච්ඡේදය අවසානයේ අවසාන තොගය අපේක්ෂිත විකුණුම් ඒකක ප්‍රමාණයට එකතුකල යුතු අතර, කාලච්ඡේදය ආරම්භයේ ආරම්භක තොග ප්‍රමාණය අපේක්ෂිත විකුණුම් ඒකක ප්‍රමාණයෙන් අඩුකල යුතුය. නමුත් සමහර අයදුම්කරුවන් ආරම්භක තොගය එකතුකර අවසාන තොගය අඩුකර තිබුණි.
- සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් අයවැයගත පාලනයේ වාසි සඳහන් කිරීමේදී සංවිධානයකට අදාලවන අයවැයගත පාලනය පිළිබඳ සඳහන් කරනවා වෙනුවට රජයේ අයවැය ලේඛනයෙහි වාසි සඳහන් කර තිබුණි.

ආරම්භක තොගය අඩුකිරීම සහ අවසන් තොගය එකතු කිරීමට හේතුව අයදුම්කරුවන් තර්කානුකූලව තේරුම්ගත යුතුය. සමහර අවස්ථාවලදී න්‍යායාත්මක ප්‍රශ්න සඳහා පහසුවෙන් ලකුණු රැස්කරගත හැකි අතර, අයදුම්කරුවන් උත්තර සැපයීමේදී විෂයට අදාලව තමන් සතුව න්‍යායාත්මක දැනුම ප්‍රදර්ශනය කිරීම අවශ්‍ය වේ. විභාගය සඳහා ඒ ඒ මාතෘකාවලට අදාලවන න්‍යායාත්මක කොටස් අවබෝධ කර ගැනීම හා අධ්‍යයනය කිරීම වැදගත් වේ.

## ප්‍රශ්න අංක 04

පිරිවැය ගිණුම් තැබීම සඳහා වන සංකලිත ගිණුම්කරණය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී.

ප්‍රශ්නයේ ඍජුවම දෙනලද අයිතමයන් හා සංඛ්‍යා භාවිත කර අමුද්‍රව්‍ය තොගපාලන ගිණුම හා නොනිමි වැඩ පාලන ගිණුම පිළියෙල කිරීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන් විසින් ඒ ඒ අයිතමයන් වාර්තාකල යුතු ගිණුම නිවැරදිව හඳුනාගැනීම සහ වාර්තා කිරීම සඳහා "T" ගිණුම් පිළියෙල කිරීම අවශ්‍යව තිබුණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි. සමහර අයදුම්කරුවන් අයිතමයන් වාර්තා කිරීමට අදාල ගිණුම නිවැරදිව හඳුනාගැනීමට අපොහොසත්ව තිබුණි.

අයදුම්කරුවන් විසින් පොදුවේ සිදුකරන ලද වැරදි පහත පරිදි වේ:

- සමහර අයදුම්කරුවන් ගිණුම්වල හර පැත්තේ සටහන් කළයුතු ගනුදෙනු බැර පැත්තේත්, බැර පැත්තේ සටහන් කළයුතු ගනුදෙනු හර පැත්තේත් වශයෙන් සටහන් කර තිබුණි. තවද සමහර අයදුම්කරුවන් අමුද්‍රව්‍ය තොග හා තොනිමි වැඩ පාලන ගිණුම්වල ආරම්භක ශේෂ ඒ් ගිණුම්වල 'බැර' පැත්තේ සටහන් කර තිබුණි.
- සමහර අයිතමයන් වාර්තා කිරීමට අදාලවන ගිණුම නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. උදාහරණයක් ලෙස නිෂ්පාදනයට අදාල සෘජු ශ්‍රම හා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය, අමුද්‍රව්‍ය පාලන ගිණුමේ සටහන් කර තිබුණි.

පාලන ගිණුම් සම්බන්ධව අමුද්‍රව්‍ය ගිණුම්කරණ ක්‍රියා පටිපාටිය හා එක් එක් ගනුදෙනුව 'හර' හා 'බැර' ලෙස සටහන් කිරීමට අදාල හේතුව අයදුම්කරුවන් තර්කානුකූලව තේරුම් ගැනීම අවශ්‍ය වේ.

## ප්‍රශ්න අංක 05

ශ්‍රමය සඳහා ගෙවීම් ක්‍රම (කාලය පදනම් කරගත් දීමනා ක්‍රම හා ප්‍රසාද දීමනා ක්‍රම) හඳුනාගැනීම හා සේවකයෙකුගේ මුළු ඉපැයීම් ප්‍රමාණය ගණනය කිරීම පිළිබඳ අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරන ලදී.

මාසයක කාලය තුල "A" සේවකයාගේ මූලික ඉපැයීම් හා ඉතිරි කළ කාලය සඳහා වූ ප්‍රසාද දීමනාව ගණනය කිරීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන් ගණනය කිරීමට අදාල තොරතුරු හඳුනාගැනීම සඳහා ප්‍රශ්නය හොඳින් කියවීම හා ඒවා ගණනය කිරීම සඳහා නිවැරදිව භාවිත කිරීම අවශ්‍යව තිබුණි.

මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි. බොහොමයක් අයදුම්කරුවන් මූලික ඉපැයීම් පහසුවෙන් ගණනය කර තිබුණද ප්‍රසාද ඉපැයීම ගණනය කිරීම සිදු නොකර තිබුණි.

අයදුම්කරුවන් විසින් පොදුවේ සිදුකරන ලද වැරදි පහත පරිදි වේ:

- සමහරක් අයදුම්කරුවන් මූලික ඉපැයීම ගණනය කිරීම සඳහා දිනකට සාමාන්‍යයෙන් වැඩකරන පැය ගණන හා සාමාන්‍ය වේතන අනුපාතය සැලකිල්ලට ගෙන තිබුණද මාසය සඳහා වන ඉපැයීම් ගණනය කිරීම සඳහා අදාල මාසයේ වැඩකරන දවස් ගණන සැලකිල්ලට ගෙන නොතිබුණි.
- සමහරක් අයදුම්කරුවන් ප්‍රසාද දීමනාව ගණනය කිරීම සඳහාද සාමාන්‍ය වේතන අනුපාතය යොදාගෙන තිබුණි.
- සමහරක් අයදුම්කරුවන් ඉතිරිකරන ලද පැය ගණන වෙනුවට අමතරව නිෂ්පාදනය කරන ලද ඒකක ප්‍රමාණයට ප්‍රසාද වැටුප් වේතන අනුපාතය අදාල කර තිබුණි.
- සමහරක් අයදුම්කරුවන් ප්‍රසාද දීමනාව මූලික ඉපැයීමෙන් 50% ක් ලෙස සෘජුවම ගෙන තිබුණි.

අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය හොඳින් කියවා ගණනය කිරීම්වල පදනම හඳුනා ගැනීමත් ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන්නේ කුමක්දැයි තේරුම් ගැනීමත් වැදගත් වේ. මෙම ප්‍රශ්නය සඳහා සංකීර්ණ න්‍යායාත්මක කොටස් නොව ප්‍රශ්නය හොඳින් තේරුම් ගැනීම වැදගත් වේ.

## ප්‍රශ්න අංක 06

කොන්ත්‍රාත් ගිණුම් පිළියෙල කිරීම හා කොන්ත්‍රාත්තුවක පිරිවැය ගණනය කිරීමට අදාලව අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන ලදී.

ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත විය. පළමුවන කොටසේදී කොන්ත්‍රාත් ගිණුම පිළියෙල කිරීමත් දෙවන කොටසේ කොන්ත්‍රාත්තුව අදාල පිරිවැය හඳුනාගැනීමත් අවශ්‍ය විය.

බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සාර්ථකව උත්තර සපයා නොතිබුණි. මෙම ප්‍රශ්නය සඳහා උත්තර සැපයූ බොහොමයක් අයදුම්කරුවන් කොන්ත්‍රාත් ගිණුම නිවැරදිව පිළියෙල කර නොතිබුණි. බොහෝ අයදුම්කරුවන් පිරියතයේ පිරිවැයද, කොන්ත්‍රාත් පිරිවැයේ කොටසක් ලෙස හඳුනාගෙන තිබුණි. මෙයට අමතරව අයදුම්කරුවන් ප්‍රශ්නය හොඳින් කියවා පරීක්ෂකගේ අපේක්ෂිතයන් හඳුනාගැනීම වැදගත් වේ. කොන්ත්‍රාත් ගිණුම පිළියෙල කිරීම හා කොන්ත්‍රාත්තුවට අදාල පිරිවැය හඳුනා ගැනීම ලෙස ප්‍රශ්නය කොටස් දෙකකින් යුක්ත විය. සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් අමුද්‍රව්‍ය පිරිවැය, වැටුප් හා ක්ෂයවීම් හඳුනාගෙන තිබුණත් කොන්ත්‍රාත්තුවට අදාල මුළු පිරිවැය නිවැරදිව හඳුනාගැනීමට අපොහොසත්ව තිබුණි. මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට අදාල කුසලතාවය දියුණු කර ගැනීම සඳහා විෂය කොටස තේරුම් ගැනීමත් ස්ව-අධ්‍යයන පොතේ හා පසුගිය විභාග ප්‍රශ්නවල ඇති සරල ප්‍රශ්න පුහුණුවීමත් අවශ්‍ය වේ.

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

### ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නයේදී අයදුම්කරුවන්ගේ පෙරසැරි I ගිණුම පිළියෙල කිරීම, සාමාන්‍ය අපතය ප්‍රමාණය හා වටිනාකම හඳුනා ගැනීම, නිමැවුම් වටිනාකම ගණනය කිරීම, අසාමාන්‍ය අපතය හා ඒකකයක මිල ගණනය කිරීම පිළිබඳ හැකියාව පරීක්ෂා කරන ලදි.

සාමාන්‍යයෙන්, බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සපයා තිබුණි. සමහරක් අයදුම්කරුවන් උත්තර සැපයීමේදී පෙරසැරි ගිණුමේ අදාල ආකෘතිය භාවිත කර නොතිබුණි. මෙම ප්‍රශ්නයට උත්තර සැපයූ බොහොමයක් අයදුම්කරුවන් සාමාන්‍ය අපතය නිවැරදිව ගණනය කර තිබුණි. එහෙත් සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් නිමැවුම නිවැරදිව ගණනය කර තිබුණද අසාමාන්‍ය අපතය හා නිමැවුමේ වටිනාකම නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් විය. බොහොමයක් අයදුම්කරුවන් සාමාන්‍ය අපතය, පෙරසැරි II, අසාමාන්‍ය අපතය යන ගිණුම් පිළියෙල කිරීම සඳහා ද අනවශ්‍ය ලෙස කාලය මිඩංගු කර තිබුණි.

අයදුම්කරුවන් පෙරසැරි ගිණුම්කරණයට අදාල සංකල්ප ඉගෙන ගැනීමත් ස්ව-අධ්‍යයන පරිශීලක ග්‍රන්ථයෙහි හා පසුගිය ප්‍රශ්න පත්‍රවල ඇති ප්‍රශ්නවලට උත්තර සපයා පුහුණුවීමත් සිදුකළ යුතුය. සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබාගැනීම සඳහා ප්‍රශ්නයට උචිත ආකෘතිය භාවිත කිරීමෙත් සංකල්පය නිවැරදිව තේරුම් ගැනීමත් ඉතා වැදගත් වේ.

### ප්‍රශ්න අංක 08

විකුණුම් වටිනාකම, නිමැවුම හා අවසාන තොග වටිනාකම සහ ආන්තික පිරිවැයකරණය යටතේ අදාලවන අනෙකුත් තොරතුරු හඳුනා ගනිමින් ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීමට හා සමච්ඡේද ලක්ෂ්‍යය [Break-Even Point (BEP)] ඒකක ප්‍රමාණය ගණනය කිරීමට අදාල දැනුම පරීක්ෂා කරන ලදි.

(a) බොහොමයක් අයදුම්කරුවන් ආන්තික පිරිවැයකරණ සංකල්පය අනුව මෙම ප්‍රශ්නයට උත්තර සපයා නොතිබුණි. සමහරක් අයදුම්කරුවන් සත්‍ය විකුණුම් ඒකක ප්‍රමාණය හා ස්ථාවර පිරිවැය වෙනුවට අදාල අගයන්ගේ අයවැයගත අගයන් උපයෝගී කරගෙන තිබුණි. ප්‍රශ්නයෙන් අපේක්ෂා කරනුයේ ආන්තික පිරිවැයකරණ ක්‍රමය යටතේ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම බව ඉතා පැහැදිලිව සඳහන් කර තිබුණත් සමහර අයදුම්කරුවන් කාලය අනවශ්‍ය ලෙස වැය කරමින් අධි/ඌන අන්තර්ග්‍රහණය ගණනය කර තිබුණි.

(b) බොහොමයක් අයදුම්කරුවන් සමච්ඡේද ලක්ෂ්‍යය (ඒකක) සමීකරණය අනුව මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණි. සමච්ඡේද ලක්ෂ්‍ය ඒකක ප්‍රමාණය ගණනය කිරීමේදී බොහොමයක් අයදුම්කරුවන් සත්‍ය ස්ථාවර පොදුකාර්ය පිරිවැය වෙනුවට අයවැයගත ස්ථාවර පොදුකාර්ය පිරිවැය යොදාගෙන තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් දායකය නිවැරදිව ගණනය කර තිබුණි.

වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා අයදුම්කරුවන් ප්‍රශ්නය හොඳින් කියවීම විෂය ක්ෂේත්‍රය තේරුම් ගැනීම හා විෂය නිර්දේශයේ න්‍යායාත්මක කොටස් කෙරෙහි අවධානය යොමු කිරීම සිදුකළ යුතුය.

### ප්‍රශ්න අංක 09

(a) කොටස, සඳහා එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුවට පොදුකාර්ය විභජනය කර බෙදාහරින ආකාරය පෙන්වන ප්‍රකාශනයක් පිළියෙල කිරීමත් (b) කොටස සඳහා එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ සෘජු ශ්‍රම පැයකට පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතිකය පිළියෙල කිරීමත් අවශ්‍ය විය.

සැම අයදුම්කරුවෙකුම පාහේ මෙම ප්‍රශ්නය සඳහා උත්තර සපයා තිබුණු අතර, ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමටද සමත්ව තිබුණි.

අයදුම්කරුවන් විසින් සිදුකරන ලද ප්‍රධාන වැරැද්දක් වූයේ සෘජු ශ්‍රම පැයද පොදුකාර්යයක් ලෙස හඳුනා ගැනීම සහ එය පිරිවැය අයිතමයක් ලෙස සැලකිල්ලට ගැනීමයි.

සමහර අයදුම්කරුවන් එක් එක් පොදුකාර්ය විභජනය කිරීමට අදාල පදනම නිවැරදිව හඳුනාගෙන නොතිබුණු අතර, ගණනය කිරීමට අදාලව ප්‍රශ්නයේ දී තිබූ සංඛ්‍යාවන්ම නැවත ලිවීම සිදුකර තිබුණු.

සංඛ්‍යාවන් දහස් වලින් සඳහන් කිරීමේදී අයදුම්කරුවන් විසින් පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතය වැරදි ලෙස ගණනය කර තිබුණි.

සේවා දෙපාර්තමේන්තු පිරිවැය අන්තර්ග්‍රහණය කිරීම බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදිව සිදුකර තිබුණි.

වැඩි වැඩියෙන් පුරුදු පුහුණුවීමත් සංකල්ප තේරුම් ගැනීමත් අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා උපකාරි වේ.

## D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

### ප්‍රශ්න අංක 10

**(A) කොටස**

මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත විය. (A) කොටස, ලකුණු 14 ක් සඳහා විචලනයන් ගණනය කිරීම සඳහා වූ අනු ප්‍රශ්න 07 කුත් (B) කොටස ලකුණු 11 ක් සඳහා වන මුදල් අයවැය පිළිබඳ ප්‍රකාශනයකුත් ලෙස විය.

සමස්තයක් ලෙස අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවූ අතර, අයදුම්කරුවන් ස්වල්ප දෙනෙක් පමණක් සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ලබාගෙන තිබුණි.

ප්‍රධාන වශයෙන් හඳුනාගත් වැරදි හා අඩුපාඩු පහත පරිදි වේ:

**(A) කොටස:**

- සමහරක් අයදුම්කරුවන්ට විචලනයන් පිළිබඳ මූලික සංකල්ප පිළිබඳ පැහැදිලි අදහසක් නොතිබුණි.
- සමහරක් අයදුම්කරුවන් සම්පූර්ණ අවබෝධයකින් තොරව වැරදි සමීකරණ ලියා තිබුණි.
- සමහරක් අයදුම්කරුවන් පියවර වශයෙන් උත්තර සපයනවා වෙනුවට අවසන් උත්තරය පමණක් සඳහන් කර තිබුණි.
- සමහරක් අයදුම්කරුවන් විචලනයන් ගණනය කර තිබුණත් එය වාසිදායකද , අවාසිදායකද යන්න සඳහන් කර නොතිබුණි.

**(B) කොටස:**

- සමහරක් අයදුම්කරුවන් මුදල් අයවැය පිළියෙල කරන ආකෘතිය පිළිබඳව සහ මුදල් අයවැය පිළියෙල කිරීමට හේතුව පිළිබඳ පැහැදිලි අදහසක් නොවීය.
- සමහරක් අයදුම්කරුවන්, සංඛ්‍යාවන් "T" ගිණුමක සඳහන් කර තිබූ අතර, විස්තරාත්මක / ඡේද වශයෙන් වූ වෙනත් වැරදි ආකෘතිද උපයෝගී කරගෙන තිබුණි.
- ප්‍රශ්නය හොඳින් කියවා නොතිබීම නිසා බොහොමයක් අයදුම්කරුවන් ගෙවිය යුතු විකුණුම් කොමිස් සඳහා වන ගැලපිල්ල, ලැබිය යුතු අයිතමයක් ලෙස හඳුනාගෙන තිබුණි.
- සමහරක් අයදුම්කරුවන් විකුණුම්, ගැනුම් හා විකුණුම් කොමිස් මාසිකව බෙදා හැරීමේදී වැරදි සිදුකර තිබුණි.
- සමහරක් අයදුම්කරුවන් උත්තර සැපයීමට උත්සාහයක් හෝ ගෙන නොතිබුණි.
- මුදල් අයවැය පිළිබඳ ප්‍රශ්නය සඳහා ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අයදුම්කරුවන් නිවැරදි ආකෘතිය භාවිත කර උත්තර සැපයීම හා ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂයන් අදාල මාසය සඳහා නිවැරදිව බෙදාහැරීම අවශ්‍ය වේ.

**ඉහත සඳහන් වැරදි හා අඩුපාඩු මගහරවා ගැනීම සඳහා වන යෝජනාවන් පහත පරිදි වේ :**

- පළමුවෙන්ම සියලුම අයදුම්කරුවන් ප්‍රශ්නය **හොඳින් කියවීම** අවශ්‍ය වේ. හොඳින් කියවූවහොත් විකුණුම් කොමිස් පිළිබඳව වූ වැරැද්ද වැනි වැරදි මගහරවා ගත හැක.

- විෂය සහ අදාල මාතෘකා පිළිබඳව අයදුම්කරුවන්ට **පුළුල් අවබෝධයක්** තිබිය යුතුය. ඒ සඳහා **ස්ව-අධ්‍යයන පොත භාවිත කිරීම අවශ්‍ය වේ.**

- විචලන සඳහා අවසන් උත්තරය ලබා ගැනීමට **පෙරවැඩ නිවැරදිව සැපයීමත් පියවර හා අනෙකුත් අදාල සමීකරණ නිවැරදිව සඳහන් කිරීමත්** සුදුසුකළ යුතුය.

- අවසන් උත්තරයට අමතරව පියවර සඳහාද ලකුණු වෙන්කර ඇති බව අයදුම්කරුවන් දැන සිටිය යුතුය.

\- - -

<u>**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැළකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**</u>

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

3. ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.

4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරීක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.

7. ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.

8. මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.

9. විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මගින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.

10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -